# චතාරික සමය තීව්‍ර කිරීමෙහිලා උපයෝගි වන්නා වූ ගද්‍ය - පද්‍ය ගායන ශෛලීන් පිළිබඳ අධ්‍යයනයක්: තෝරාගත් ප්‍රදේශ කීපයක කතෝලික ජන ජීවිතය ඇසුරිනි

**අයි. එස්. වීරක්කොඩි**
**සංගීතවිද්‍යා අධ්‍යයනාංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය**
***isamindani@gmail.com***

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ වන්දනාමාන කිරීම උදෙසා ශුද්ධ වූ සභාව විසින් හඳුන්වා දී ඇති ජනවන්දනා වසර  ප්‍රධාන කාල පරිච්ඡේද පහකින් සමන්විත වේ. චතාරික සමය ඉන් එක් කාල පරිච්ඡේදයකි.

ජේසුස් ක්‍රිස්තුන්ගේ දුක්ඛප්‍රාප්තිය සිහිකිරීම හා බැඳි කතෝලික වත්පිළිවෙත් රාශියක් වේ. අළු බදාදා සිට පාස්කු ඉරිදා දක්වා සති හයහමාරක (දින 40)  චතාරික සමය තීව්‍ර කිරීම උදෙසා දේවස්ථානය ආශ්‍රිත ව මෙන් ම  නිවෙස් ආශ්‍රිත ව ද ගද්‍ය හා පද්‍ය ගායන උපයෝගී කරගැනීම දැකගත හැකි විශේෂතාවකි. කුඩා කණ්ඩායම් ඒකරාශි වී ගායනය කරනු ලබන පසන් ගී ඉන් එකකි. මෙම චාරිත්‍රය ශ්‍රී ලංකාවේ ඇති වූයේ පෘතුගීසි ආගමනයෙන් පසුව විය යුතු වේ. වර්තමානයේ පවතිනුයේ ජාකෝමේ ගොන්සාල්වේස් පියනම ඇති කළ සම්ප්‍රදාය යි. චතාරික සමය තුළ ගායන ශෛලීන් කිහිපයක් භාවිත වන බව ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී හඳුනා ගැනිණ. දේශනා නවයේ පසන්පොත, අත් අකුරු පසන්, ළතෝනි පසන් ගායන ශෛලිය තුළ උපයෝගි වන ගායන ප්‍රකාර වේ.

මුඛ පරම්පරාගත නාද මාලාවලින් යුත් පසන් ගායන, ප්‍රාදේශීය විවිධතාවලින් සමන්විත වේ. චතාරික සමය තුළ පද්‍යවලට අමතර ව ගද්‍ය ගායන ශෛලියක් ද භාවිත වේ. ‘දුක්ඛප්‍රාප්ති ප්‍රසංගය’ නම් වූ දේශනා සංග්‍රහය මෙසේ ගද්‍ය ගායන ස්වරූපයෙන් ඉදිරිපත්වීම දැකගත හැකි ය. මුන්නක්කරෛ ප්‍රදේශය තුළ පිරසංගම් ලෙස හඳුන්වා ඇති අතර, දෙමළ බසින් මෙම ගද්‍ය ගායන ඇසිය හැකි වේ. කතෝලික සුළුතරයකට පමණක් සීමා වූ, කතෝලික ජන ජීවිතය හා බැඳි පවතින ගද්‍ය - පද්‍ය ගායන චතාරික සමය තීව්‍ර කිරීමට උපයෝගී වන්නා වූ ආකාරය මෙහිදී ඉදිරිපත් කෙරේ. ඒ  පිළිබඳ විමසා බැලීමේ පර්යේෂණ  ක්‍රමවේදය ලෙස ක්ෂේත්‍ර අධ්‍යයනය යොදා ගැනුණි. සම්මුඛ සාකච්ඡා, සහභාගිත්වය නිරීක්ෂණ, ගායන ශ්‍රවණය, පටිගත කරගැනීම, අභිචාරයන්හි නියැලීම දත්ත රැස්කිරීමේ ක්‍රම අනුගමනය කෙරිණ.

***ප්‍රමුඛ පදඃ*** *චතාරික සමය, දුක්ඛප්‍රාප්තිය, ජන ගායන ශෛලිය, පසන් ගී, කතෝලික ජන දිවිය*